**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහ එහි ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සහ ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම - 2021**

---

## 1.1. තත්ත්වාගණනය කළ මතය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහ එහි ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සහ ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2021 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය සහ සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය සහ සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ සහ සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මණ්ඩලයේ සහ සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන

#### 1.5.1.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතිමුත් තවදුරටත් භාවිතා කරමින් පවතින රු.32,781,134 ක පිරිවැය වූ දේපල පිරියත උපකරණවල ඵලදායී ජීවිත කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති වත්කම් තුළ භාවිතා කළ හැකි වත්කම් මෙන්ම පූර්ණ වශයෙන් භාවිතා කළ නොහැකි වත්කම් ද පවතී. එම වත්කම් නැවත භාවිතයට ගත්තද ප්‍රායෝගිකව නැවත තක්සේරු කර ගිණුම් තැබිය නොහැකි අතර, දීර්ඝ කාලයක් පැරණි ගෘහ භාණ්ඩ, පරිගණක හා දෘඩාංග හා කාර්යාල උපකරණ ආදිය මේ තුළ ඇතුළත් වේ. මෙම වත්කම් යාවත්කාලීන කිරීම්, නව උපාංග සවිකිරීම් ආදිය සිදුකළ නොහැක. භාවිත තත්ත්වයේ නොපවතින වත්කම් ඉදිරියේදී ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ඵලදායී ජීවිත කාලය සමාලෝචනයට භාජනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 හි 59 වන ඡේදය ප්‍රකාරව ගොවි විශ්‍රාමිකයින් සඳහා වන මරණ පාරිතෝෂිකය ආයු ගණක තක්සේරුව මඟින් ගණනය කළ යුතු වුවද 2021 දෙසැම්බර් 31 දිනට රු.1,146,766,066 ක් වූ ගොවීන්ගේ මරණ පාරිතෝෂික අරමුදල සම්බන්ධ බැරකම් ආයු ගණක තක්සේරුව මඟින් ගණනය කර කාලානුරූපීව ප්‍රතිපාදනයන් කර නොතිබුණි. | ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙන් වාර මුදල් ලබාගෙන මෙම අරමුදල ක්‍රියාත්මක කරගෙන යනු ලබන අතර, වර්ෂය තුළ සිදුකරනු ලබන පාරිතෝෂික ගෙවීම් මෙම අරමුදලට හර කරනු ලබයි. ඉදිරියේදී නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ආරම්භ වීමත් සමගම වාර්ෂිකව ආයුගණක තක්සේරුව සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. | මරණ පාරිතෝෂික අරමුදල සම්බන්ධ බැරකම් ආයුගණක තක්සේරුව මඟින් කාලානුරූපීව ගණනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති මගින් හඳුන්වා දෙනු ලබන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා වූ ආකෘතිමය රාමුව තුළ ගුණාත්මක අනුලක්ෂණයක් ලෙස හඳුන්වා දී ඇති සංසන්දනාත්මකභාවේ සංකල්පය ප්‍රකාරව, සමාන ගනුදෙනු සහ අනෙකුත් සිදුවීම්වල මූල්‍ය ප්‍රතිඵලය මැනීම සහ විදහා පෙන්වීම අස්තිත්වයක් පුරාම සංගත වන ලෙසට සහ කාලයක් තිස්සේ එම අස්තිත්වයට සහ වෙනත් අස්තිත්වයන් සඳහා සංගත වන ලෙසට කරගෙන යා යුතු වුවත්, ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සහ ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ පිළිවෙලින් පරිපාලන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලද රු 247,000,000 ක් වූ ප්‍රදාන, රාජ්‍ය ප්‍රදාන ලෙසත් රු.1,500,000 ක් වූ ප්‍රදාන, වෙනත් ආදායම් ලෙසත් ආදායම් ප්‍රභව දෙකක් යටතේ සමූහයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | සමාන ගනුදෙනු සහ අනෙකුත් සිදුවීම්වල මූල්‍ය ප්‍රතිඵලය මැනීම සහ විදහා පෙන්වීම අස්තිත්වයක් පුරාම සංගත වන ලෙසට සහ කාලයක් තිස්සේ එම අස්තිත්වයට සහ වෙනත් අස්තිත්වයන් සඳහා සංගත වන ලෙසට සිදුකළ යුතුය. |

**1.5.1.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මහියංගනය, ඇඹිලිපිටිය සහ අනුරාධපුරයෙහි පවත්වාගෙන යනු ලබන නිල නිවාස 3 පිහිටි මණ්ඩලයට අයත් පර්චස් 76.6 ක් වූ ඉඩම් සහ ඇඹිලිපිටිය නිල නිවාසයේ ගොඩනැගිලි වටිනාකම, තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | වටිනාකම තක්සේරු කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර, කඩිනමින් එම කටයුතු අවසාන කර තක්සේරු වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | ගොඩනැගිලි තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය වෙතින් සහ මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය වෙතින් කෘෂිකාර්මික දත්ත පද්ධතියක් ගොඩනැගීම සඳහා 2021 දෙසැම්බර් 31 දින වන විට රු.14,715,617 ක මූල්‍ය පහසුකම් මණ්ඩලය වෙත ලබාදී තිබුණු අතර 2021 වර්ෂය වන විට මණ්ඩලය විසින් රු.23,009,698 ක වියදම් දරා තිබුණි. එම ලැබීම් සහ ගෙවීම්, ආදායම් සහ වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල නොදක්වා, ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදමින් මූල්‍ය ආයතන විසින් නොපියවා ඇති ශේෂය පමණක් ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | මෙම තොරතුරු පද්ධතිය කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් සිදුකරනු ලබන අතර, අදාළ වියදම් කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා ප්‍රතිපූරණය කරනු ලබයි. ඊට අදාළ සියලුම ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත කර ඇති අතර, ගිණුම් සටහන් මගින්ද අනාවරණය කර ඇත. | ව්‍යාපෘතියට අදාළ ආදායම් සහ වියදම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

**1.5.2 ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශන**

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 හි 59 වන ඡේදය ප්‍රකාරව, සක්‍රීය දායකයන් හා ගොවි විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම කාලානුරූපීව සිදුකරනු ලබන ආයුගණක තක්සේරුව මගින් ගණනය කළ යුතු වුවද | 2007 වර්ෂයේදී ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ වගකීම පිළිබඳ සිදු කරන ලද ආයුගණක තක්සේරුව පදනම් කරගෙන විශ්‍රාම වැටුප් වගකීම ගිණුම් ගත කර ඇත. මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ස්වයං මූල්‍ය පදනමකින් යුක්ත නොවන | විශ්‍රාම වැටුප් වගකීම ආයුගණක තක්සේරුව අනුව |

| | | |
|---|---|---|
| 2007 වර්ෂයෙන් පසු දිගින් දිගටම ආයුගණක තක්සේරුවක් සිදු කිරීමකින් තොරව විශ්‍රාම වැටුප් වගකීම ගණනය කර තිබුණු අතර එසේ ගණනය කරන ලද විශ්‍රාම වැටුප් වගකීම 2021 දෙසැම්බර් 31 දිනට රු.78,184,784,968 ක් විය. තවද මෙම බැදීම් පියවීමට ප්‍රමාණවත් ආයෝජනයක් අරමුදල විසින් සිදුකර නොතිබුණි. | බැවින් මෙම යෝජනා ක්‍රමය සඳහා නව බඳවාගැනීම් සිදුනොකරන අතර, ස්වයං මූල්‍ය පදනමකින් ක්‍රියාත්මක කළ හැකි නව යෝජනා ක්‍රමයක් ස්ථාපනය කර ඇත. පැරණි යෝජනා ක්‍රමයේ ගෙවීම් වාර්ෂික අයවැය ප්‍රතිපාදන තුළින් වාර්ෂිකව ගෙවීම් කරනු ලබන අතර, නව ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයේ ආයුගණක තක්සේරුව ලබාගන්නා අවස්ථාවේදී පැරණි යෝජනා ක්‍රමයේද ආයුගණක තක්සේරුව ලබාගැනීම සිදුකරයි. | කාලානුරූපීව ගණනය කළ යුතුය. |

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) සක්‍රිය දායකයින්ගෙන් ගිණුම් වර්ෂය සඳහා ලැබිය යුතු දායක මුදලේ වටිනාකම හඳුනාගැනීමට හැකිවන පරිදි, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා බැඳුන දිනය සහ හිමිකම්පාන දිනය ඇතුළත් දායකයින්ගේ නාම ලේඛනය සම්පූර්ණව සහ යාවත්කාලීනව පවත්වාගෙන නොයාම නිසා දායකයින්ගෙන් ලද ආදායම උපචිත පදනම වෙනුවට මුදල් පදනමට රු.112,139,246 ක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | පසු වාරික පරිගණක ගත කිරීමේ ප්‍රමාදයන් සිදුවී ඇති බැවින් අවලංගු වූ හා අක්‍රිය වූ දායකයින් පද්ධතිය තුළින් ලබාගැනීමට අපහසු වී ඇත. මෙම තත්ත්වය හමුවේ පසු වාරික ස්වයංක්‍රීයව පරිගණක ගත කිරීම සඳහා රාජ්‍ය වාණිජ බැංකු මඟින් පසු වාරික අයකර එම වාරික අප දත්ත පද්ධතියට සම්බන්ධ කරගැනීමේ විශේෂ වැඩපිළිවෙලක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ. | සියලුම දායකයින්ගේ නාම ලේඛනය සම්පූර්ණව සහ යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු අතර දායක මුදල් උපචිත පදනමට ගිණුම් ගත කළ යුතුය. |
| (ii) 2021 වර්ෂය තුළදී පුද්ගලයින් 161 දෙනෙකුට හිමි ශුද්ධ වාරික ගෙවීම්, ඊට අදාළ පොලිය, බෙලහීන ගෙවීම් සහ මරණ පාරිතෝෂික මුදල් සඳහා ලියන ලද රු.1,304,300 ක් වූ චෙක්පත් 161 ක් ආදායකයින් හිමිකම් නොපාන බව තහවුරු කර නොගෙන ආදායමට ගෙන තිබුණි. | ශුද්ධ වාර මුදල් ගෙවීම්, මරණ පාරිතෝෂික හා බෙලහීන ප්‍රතිලාභ ගෙවීම් වෙනුවෙන් නිකුත් කරනු ලැබූ, ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත්වල කාලය ඉකුත් වූ විට එම චෙක්පත් ආදායමට ගැනීම සිදු කරනු ලබන අතර, එම චෙක්පත් සඳහා දිස්ත්‍රික් කාර්යාලය හරහා අපවෙත ලැබෙන ඉල්ලීම් අනුව නැවත චෙක්පත් නිකුත් කරනු ලබයි. කාලය ඉකුත්වන චෙක්පත් නියමිත පරිදි ලේඛනගත කර තබන අතර ඕනෑම අවස්ථාවක දායකයා විසින් හිමිකම් පෑමක් සිදුකරන අවස්ථාවලදී අදාළ දිස්ත්‍රික් කාර්යාලයේ නිර්දේශ අනුව නැවත ආදායකයා වෙත චෙක්පත් නිකුත් කරනු ලබයි. මණ්ඩලය විසින් විශාල වශයෙන් චෙක්පත් නිකුත් කරනු ලබන අතර, එම චෙක්පත් වලින් මුදල් කර නොගන්නා චෙක්පත් නිරන්තරයෙන් සැසඳුම් වලට ලක්වේ. | ආදායමට ගැනීමට පෙර ආදායකයින් හිමිකම් නොපාන බව තහවුරු කර ගත යුතුය. |
| (iii) පෙර වර්ෂයේ ගොවි විශ්‍රාම වැටුප් වලින් ගොවීන් වෙත නොගෙවූ රු.107,929 ක් සමාලෝචිත වර්ෂයේ ආපසු පොත්වලට ගැනීමේදී තැපැල් කාර්යාල ගිණුමට හර කර ගෙවිය යුතු | මණ්ඩලය වෙත ලැබිය යුතු, නොගෙවූ විශ්‍රාම වැටුප් මුදල් තැපැල් දෙපාර්තමේන්තුවේ දිසා ගණකාධිකාරීවරයාගේ සනාථ කිරීම් මත පෙර වර්ෂයේදී ගිණුම් ගත කර ඇති අතර, 2021 වර්ෂය තුළ මුදල් ලැබීමේදී පෙර වර්ෂයේ සනාථ | සිදුව ඇති වරද නිවැරදි කළ යුතුය |

| | | |
|---|---|---|
| ගොවි විශ්‍රාම වැටුප් ගිණුමට බැර කිරීම වෙනුවට සදොස් ලෙස වර්ෂයේ ගොවි විශ්‍රාම වැටුප් වියදම් ගිණුමට බැර කිරීම නිසා වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩි වී තිබුණි. | නොකළ රු.107,929 ක මුදල් ලැබී ඇත. ඒ අනුව ගිණුම්ගත කළ ලැබිය යුතු ශේෂය එම මුදල් ප්‍රමාණයෙන් අඩුවී ඇත. ලැබුණු මුදල්, ලැබිය යුතු නොගෙවූ විශ්‍රාම වැටුප් ගිණුමට (තැපැල් කාර්යාල) බැර කර අතිරික්තය ගොවි විශ්‍රාම වැටුප් වියදමට ගිණුම් තබා ඇත. | |

**(ඇ) අරමුදලේ අඛණ්ඩ පැවැත්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යෝජනා ක්‍රමයේ ශුද්ධ වත්කම් සමාලෝචිත වර්ෂය අවසානයට රු.81,967,040,765 ක සෘණ ශේෂයක් ගෙන තිබුණු අතර ජංගම වත්කම් ඉක්මවා ජංගම වගකීම් රු.4,779,128,996 ක් වී තිබුණි. 2020 හා 2021 වර්ෂවලදී ගොවීන්ගේ දායකත්වය පිළිවෙලින් රු.19,316,409 ක් හා රු.15,746,696 ක් වූ අතර ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම් පිළිවෙලින් රු.4,502,560,108 හා රු.3,719,165,280 ක් වී තිබුණි. විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා 2020 හා 2021 වර්ෂවලදී පිළිවෙලින් රු.4,450,949,000 ක් සහ රු.3,753,000,000 ක් භාණ්ඩාගාරය මඟින් ලැබී තිබුණු අතර භාණ්ඩාගාරයේ දායකත්වය නොමැතිව යෝජනා ක්‍රමය පවත්වාගෙන යා නොහැකි තත්ත්වයක පවතී. | ගොවි විශ්‍රාම වැටුප් වගකීම වාර්ෂිකව වැඩිවන අතර, යෝජනා ක්‍රමය තුළ ආයෝජන නොමැතිකමත් මෙම යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ වාරික මුදල් වැඩිකිරීමකින් තොරව අවස්ථා කිහිපයකදී රාජ්‍ය ප්‍රතිපත්ති නිසා වැඩිකිරීම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත වී ඇති අතර, සෑම වර්ෂයකදීම රජයේ අයවැය මගින් මුදල් වෙන්කර ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සිදුකරගෙන යනු ලැබේ. | යෝජනා ක්‍රමයට රක්ෂිතයන්ගේ දායකත්වය වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.3 ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය මූල්‍ය ප්‍රකාශන**

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i). ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 හි 43 ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී මුදල් හෝ මුදල් හා සමාන දෑ යොදාගැනීම අවශ්‍ය නොවන ආයෝජන හා මූල්‍ය ගනුදෙනු මුදල් ප්‍රවාහ ප්‍රකාශයකින් ඉවත් කළ යුතු වුවත් ධීවර විශ්‍රාමිකයින් සඳහා වූ මරණ පාරිතෝෂික අරමුදලට වෙන්කරන ලද රු.1,752,840 ක දායකය සදොස් ලෙස ආයෝජන මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණි. | ධීවරයන්ගේ මරණ පාරිතෝෂික අරමුදලට වෙන් කරන ලද ප්‍රමාණය මුදලින් ගෙවා නොමැති නිසා වෙන් කිරීම මෙහෙයුම් කටයුතු යටතේ දැක්වීමට 2022 වර්ෂයේ සිට කටයුතු කරනු ලැබේ. | වෙන් කිරීම් මුදල් ප්‍රවාහයට නොගත යුතුය. |
| (ii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතිමුත් තවදුරටත් භාවිතා කරමින් පවතින රු.696,175 ක පිරිවැය වූ ලී බඩු සහ සවි කිරීම්, කාර්යාල උපකරණ සහ පරිගණක වැනි වත්කම්වල ඵලදායී ජීවිත කාලය | ලීබඩු හා සවිකිරීම්, පරිගණක උපාංග හා කාර්යාල උපකරණ ආදිය භාවිතා කළ ද අගයකර ඵලදායී ජීවිත කාලය තක්සේරු කළ නොහැක .ඉවත් කළ යුතු තත්ත්වයේ පවතින පරිගණක වැනි උපකරණ යාවත්කාලීන කළ නොහැකි තත්ත්වයේ සහ පූර්ණ | සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | කාර්යක්ෂමතාවයෙන් භාවිතා කළ නොහැකි තත්ත්වයේ පවතින බැවින් ඉදිරියේදී ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (iii). 2021 දෙසැම්බර් 31 දිනට සක්‍රීය දායකයන් හා ධීවර විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම රු.4,644,164,591 ක් විය. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 හි 59 වන ඡේදය ප්‍රකාරව සක්‍රීය දායකයන් හා ධීවර විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම සඳහා ආයුගණක තක්සේරුව කාලානුරූපීව සිදු කළ යුතු වුවද 2007 වර්ෂයෙන් පසුව විශ්‍රාම වැටුප් වගකීම ආයුගණක තක්සේරුව මඟින් ගණනය කර නොතිබුණි. | 2007 වර්ෂයේ ආයුගණක තක්සේරුව මත පදනම්ව වගකීම ගණනය කර ඇති අතර මණ්ඩලයේ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ප්‍රතිව්‍යුහගත කළ පසු ආයුගණක තක්සේරුව සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | විශ්‍රාම වැටුප් වගකීම ආයුගණක තක්සේරුව අනුව කාලානුරූපීව ගණනය කිරීම කළ යුතුය. |

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (i) ධීවර විශ්‍රාම වැටුප් අංශයෙහි කිසිදු සෘජු රාජකාරියක් ඉටු නොකරන නිලධාරීන් තිදෙනෙකුගේ සමාලෝචිත වර්ෂයේ සම්පූර්ණ වැටුප් එකතුව රු.1,979,712 යෝජනා ක්‍රමයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මෙම නිලධාරීන් බඳවාගෙන ඇත්තේ මෙම යෝජනා ක්‍රමයේ රාජකාරි ඉටු කිරීමට වන අතර වර්තමානයේ වෙනත් රාජකාරි කටයුතු සිදු කරනු ලබයි .යෝජනා ක්‍රමයට අයත් රාජකාරි චක්‍රාකාරයෙන් වෙනත් නිලධාරීන්ද සිදු කරනු ලබන නිසා මෙම නිලධාරීන්ගේ වැටුප යෝජනා ක්‍රමයට ඇතුළත් කර ඇත. ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් බඳවා ගැනීමෙන් පසු යෝජනා ක්‍රමයට අදාළ සේවකයින්ගේ වැටුප් යෝජනා ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. | යෝජනා ක්‍රමයට අදාළ වියදම් පමණක් ගිණුම්ගත කළ යුතුය. |
| (ii) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ධීවර කාර්යාලවල දිස්ත්‍රික් ධීවර ව්‍යාපෘති නිලධාරීන් විසින් ධීවර විශ්‍රාම වැටුප් දායක මුදල් අයකිරීමේදී එක් වාරිකයකින් රු.11 බැගින් අයකරනු ලබන කොමිස් මුදල මෙම යෝජනා ක්‍රමයේ වියදමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණු අතර එම කොමිස් මුදල ධීවර විශ්‍රාම වැටුප් දායක මුදලින් ද අඩුකර ගිණුම්ගත කර තිබුණි. | දිස්ත්‍රික් ධීවර කාර්යාල මඟින් එවන ලද මුදල් වාරික යටතේ ගිණුම් ගත කර ඇති අතර ඉදිරියේදී කොමිස් මුදල ද ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | අය කරනු ලබන කොමිස් මුදල ගිණුම්ගත කළ යුතුය. |

(ඇ)　නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| ධීවර රක්ෂිතයින් 121 දෙනෙකුගෙන් ලද දායක මුදල | 146,707 | 117,648 | 29,059 | මණ්ඩලය වෙත ලද සියලු චෙක්පත් ආදායම ලෙස හඳුනාගෙන ඇති අතර සැසඳුම් නොකළ ලැබීම් කඩිනමින් සැසඳුම් කරනු ලැබේ. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීම කළ යුතුය. |

(ඈ)　අරමුදලේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යෝජනා ක්‍රමයේ විශ්‍රාම වැටුප් වගකීම සමාලෝචිත වර්ෂය අවසානයට රු.4,644,164,591 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට වඩා සියයට 9 ක වැඩි වීමකි. එසේම සමුච්චිත අරමුදලෙහි ශුද්ධ වත්කම් තත්ත්වය ඍණ රු.4,103,708,674 ක් දක්වා එනම් ඉකුත් වර්ෂයට වඩා සියයට 12 ක වැඩි වී තිබීමෙන් එයද යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි. | මෙම යෝජනා ක්‍රමය ස්වයං මූල්‍ය පදනමකින් ක්‍රියාත්මක නොවන නිසා මෙම තත්ත්වය උද්ගත වී ඇත ඒ අනුව වාර්ෂිකව ගෙවිය යුතු විශ්‍රාම වැටුප් වගකීම ඉහළ යනු ලබන අතර එම නිසා ශුද්ධ වත්කම් අගයද අඩු වේ. එම හේතු නිසා මෙම යෝජනා ක්‍රමය සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීම ප්‍රවර්ධනය නොකරයි. | යෝජනා ක්‍රමයට රක්ෂිතයන්ගේ දායකත්වය වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6　ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1　ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවුරුදු 02 සිට අවුරුදු 38 ක් දක්වා පැරණි රු. 1,519,371 ක් වූ නිලධාරීන් වෙත වැටුප් අත්තිකාරම්, ණය සහ විවිධ කාර්යයන් සඳහා ලබාදුන් අත්තිකාරම් ශේෂ සමාලෝචිත වර්ෂය තුළදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත්කර වර්ෂ 10 ට වඩා වැඩි කිසිසේත් අයකර ගැනීමට නොහැකි ණය කපාහැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීමට නියමිත අතර, අනෙකුත් සේවය අත්හිටවූ සේවකයින්ගෙන් එම මුදල් අයකිරීමට කටයුතු කරනු ලැබේ. මෙසේ ගෙවිය යුතු ශේෂ පවතින සේවකයින්ගේ පාරිතෝෂික ආදිය ගෙවීමට පෙර එම ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ණය හා අත්තිකාරම් අයකර ගැනීමට පියවර ගැනීමට කටයුතු කිරීම. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.426,871 ක් වූ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු වටිනාකම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි. | ආපසු ගෙවන ටෙන්ඩර් මුදල් ශේෂය නැවත සමාලෝචනය කර අදාළ පාර්ශවයන් දැනුවත් කර එම මුදල් ඔවුන් විසින් නිසි පරිදි ඉල්ලූවිට ගෙවීමට 2022 වර්ෂයේදී කටයුතු කරනු ලැබේ. | නොපමාව නිරවුල් කිරීමට කටයුතු කිරීම. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| 1999 අංක 20 දරන කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ පනත 7(අ) වගන්තිය | මණ්ඩලය විසින් පවත්වාගෙන ගිය කෙතට අරුණ රක්ෂණ ක්‍රමයට අදාළ ගොවීන් 8,185 කට 2017 සහ 2018 වර්ෂවල දී ගෙවන ලද රු.70,800,200 ක වන්දි මුදල්, ගිණුම් අංක, ගොවීන්ගේ නම් හා හැඳුනුම්පත් අංක නොගැලපීම හේතුවෙන් වාණිජ බැංකු මඟින් ආපසු එවා තිබුණු අතර අදාළ ගොවීන් හඳුනාගෙන එම ශේෂය නිරවුල් කිරීමට වසර 5 ක් තිස්සේ මණ්ඩලයට නොහැකිවී තිබුණි. | ගෙවීම් ප්‍රතික්ෂේපිත වූ ගොවීන් සඳහා සංශෝධිත ලේඛන සකස් කර එවන ලෙස ගොවිජන සේවා මධ්‍යස්ථාන හා දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇත. ඒ අනුව ලැබුණු සංශෝධිත ලේඛන සඳහා ගෙවා ඇතත් වන්දි මුදල් නැවත හිමිකම් නොපෑ ගොවීන්ගේ රු.70,800,200 ක මුදල ගොවියන් විසින් දිගින් දිගටම හිමිකම් නොපෑම නිසා කෘෂි රක්ෂණ අරමුදල වෙත මාරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ අතර, එම මුදල් කෘෂිකාර්මික දත්ත කළමනාකරණ පද්ධතිය නිර්මාණය කිරීම සඳහා ලබාදීමට අනුමැතිය හිමි වී ඇත. | ගොවීන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම |

### 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී යෝජනා ක්‍රමයේ ප්‍රාග්ධන වියදම් සහ ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ පරිපාලන වියදම් දැරීම සඳහා භාණ්ඩාගාරයෙන් ලද රු.267,000,000 ක මුදලින් රු.219,074,225 ක වියදම් දැරූ පසු ඉතිරි රු.47,925,775 ක් යෝජිත අරමුණට පටහැනිව භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි. | ප්‍රාග්ධන වියදම් සඳහා වර්ෂය තුළ මුදල් වර්ෂය අවසානයේදී ලැබීම නිසා 2022 වර්ෂයේදී අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදුකර ගෙවීම් කරනු ලබයි. මෙහෙයුම් හා පරිපාලන වියදම් සඳහා ලද රු. 247,000,000 ක මුදල ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා ලබාදී ඇති අතර, වර්ෂය පුරාවට කරනු ලබන සමහර වියදම් මණ්ඩලයේ ප්‍රධාන යෝජනා ක්‍රමය වන කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය මඟින් සිදුකරනු ලබන අතර, පසුව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාළ වියදම් යෝජනා ක්‍රම දෙක අතර, ගනුදෙනු හුවමාරු කරනු ලබන ජංගම ගිණුම හරහා ගැලපීම් සිදුකර ඇත. ඒ අනුව එම ජංගම ගිණුම හරහා එම මුදල් නිසි පරිදි ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ගිණුම් ගත කර ඇත. | භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන අදාළ කාර්යයට පමණක් යෙදිය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,779,698,659 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,187,412,073 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.592,286,586 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට වන්දි ගෙවීම 2020 වර්ෂයට සාපේක්ෂව රු.263,883,675 කින් අඩුවීම සහ ප්‍රති රක්ෂණයෙන් 2019 වර්ෂයේ ලැබිය යුතුව තිබුණු රු.163,619,152 ක ප්‍රතිරක්ෂණ වන්දි මුදල 2020 වර්ෂයේ කපාහැරීම සහ 2020 වර්ෂයට සාපේක්ෂව ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ පරිපාලන වියදම් සඳහා භාණ්ඩාගාර ප්‍රදාන රු.97,000,000 ක් වැඩිපුර ලැබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට මණ්ඩලයේ අනුමත තනතුරු නාම 18 න් තනතුරු 14 ක පුරප්පාඩු 156 ක් පැවති අතර ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාල හා ක්ෂේත්‍ර රාජකාරි කටයුතු ඉටු කිරීමට මෙම පුරප්පාඩු බාධාවක්ව පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. | 2021 වර්ෂයේදී සේවක බඳවාගැනීම් ආරම්භ කළ ද එහිදී සහකාර අධ්‍යක්ෂ හා සංවර්ධන නිලධාරී ඇතුළු තනතුරු කිහිපයක සේවකයින් බඳවාගත් අතර, අනෙකුත් සේවක බඳවාගැනීම් සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පැවතියදී සේවක බඳවාගැනීම් රජය විසින් අත්හිටුවීම මත සේවක බඳවාගැනීම් ප්‍රමාද වී ඇත. ඉදිරියේදී අනුමැතිය ලද වහාම අවශ්‍ය සේවක බඳවාගැනීම් සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. | පවත්නා පුරප්පාඩු සමාලෝචනය කර අත්‍යාවශ්‍ය පුරප්පාඩු පියවිය යුතුය. |